# සාහිත්‍ය මාසය

රසකාමී පරපුර නෙක දේසේ
සරසවි මුව සිප දෙයි මඳහාසේ
සැම දන පිය කරවන ඇගෙ වාසේ
සුවදායකි මේ සාහිත මාසේ

මිහිතලයේ වගතුග ගැන පොරණෝ
ආදිම මිනිසා පිළිබඳ දෙරණෝ
මහ පඬිවරු කළ සාහිතකරණෝ
නූතන ලොවටම විය හවිහරණෝ

පුස් කොළ පත් ඉරු මත කළුමැදුණු
අගනා සාහිතමය රස රැ ඳුණු
පත පොත මුළු ලොව තුති ගී පිදුණු
ජාතියකට සම්පත විය සැදුණු

හොඳ පතපොත නිති කියවන දරුවෝ
හෙට දින මේ මිහිතලයෙහි විරුවෝ
බස රැ ස දෙස සුරකින මේ සුරුවෝ
රන් මිණි මුතු නිති හිසමත දැරුවෝ

කියැවීමෙන් මිනිසා සරුවේවී
වියතුන් ලෙස පෙරමුණටම ඒවී
හරබර රස පතපොත ලියැවේවී
ලොව හෙට දින තව යහපත් වේවී

ජගත් වෙත්තසිංහ
මෙල්බන්

සන්නස සාහිත්‍ය උළෙලින්






සැප්තැම්බර් 8 වන දින ලෝක සාක්ෂරතා දිනයයි. සැප්තැම්බර් මාසය සාහිත්‍ය මාසයයි. පොත පත කෙරෙහි වෙන කවරදාකටත් වඩා අවධානයක් යොමු වන්නේ මේ සාහිත්‍ය මාසයේ දී ය.

මේ මාසය සාහිත්‍ය මාසය ලෙස නම් කරන්නට හේතු වූ ප්‍රධාන හේතුව වන්නේ ලෝක පුවත්පත් කලාවේ සදානුස්මරණීය චරිතයක් බවට පත්ව ඇති ජුලියස් ෆුචික් අනුස්මරණය කෙරෙන්නේ මේ මාසයේදී වීම ය.

ෆුචික් උපත ලැබුවේ 1903 පෙරවාරි 23 වන දින චෙකොස්ලෝවැකියාවේ ප්‍රාග් හිදී ය. ඔහුගේ පියා වානේ කම්කරුවකු විය. පසු කලෙක චෙකොස්ලෝවැකියාවේ ප්‍රධාන පුවත් පත බවට පත් වූ ''රතු අයිතිය'' පුවත් පතේ ප්‍රධාන කර්තෘ වරයා බවට පත් වන ෆුචික් දෙවන ලෝක සංග්‍රාම අවධියේ දී ඇඩොල්ෆ් හිට්ලර් ගේ වෛරයට පාත්‍ර වූ ප්‍රධාන පුද්ගලයකු බවට පත් වූයේ ඔහු හිට්ලර්ගේ කෲර පිළිවෙත සිය පුවත්පතින් දැඩි ලෙස විවේචනය කළ නිසා ය.

චෙකොස්ලෝවැකියාව හිට්ලර්ගේ නාසි හමුදාවට යටත් වූ පසු ෆුචික් අත්අඩංගුවට ගැනුණි. ඒ 1942 අප්‍රේල් 24 වන දින දී ය. යුද්ධය වෙනුවට සාමය ඉල්ලා අහිත හඬක් නැගූ ෆුචික් 1942 සැප්තැම්බර් 8 වන දින නාසි හමුදාව විසින් ඝාතනය කරන ලද්දේ ඔහුගේ නම සදානුස්මරණීය ලෙස ලෝක ඉතිහාසයේ සටහන් කර තබමිණි.

ඔහුට ගරු කරනු වස් 1948 සැප්තැම්බර් 8 වන දින ලෝක සාහිත්‍ය දිනය ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් නම් කරන ලද අතර සැප්තැම්බර් මාසය සාහිත්‍ය මාසය බවට පත් විය.

ශ්‍රී ලංකාවේ ද මේ සාහිත්‍ය මාසය ඉතා උද්යෝගයෙන් සැමරෙණු අපට පෙනෙයි. මේ ක්‍රියාකාරකම් හේතුවෙන් පොත පත කියවීම කෙරෙහි වැඩි අවධානයක් මේ මාසයේදී යොමු වනු අපට දැකිය හැකි ය. සාහිත්‍ය මාසයේදී දැකිය හැකි මේ වර්ධනය වසර පුරාවටම රැකෙනු දැකීම අපේ අභිප්‍රායයි.

## සන්නස

සෑම මාසයකම 15 වන දා නිකුත් වෙයි

## කවි කොළය

ණය දෙනවාට එරෙහිව එච්.එස්.බී.සී.
පිකට්න් කරපු අය පිළිබඳ විපක්සයේ
අහිතක් අනේ නැහැ ඒ පිළිබඳ අයියෝ
පොඩි අඩුපාඩුවක් තියෙනව කියන්නට

හිත හොඳ කමට ඔය හැටියට ණය දීමෙන්
මුදලත් මෙන්ම මිතුරත් නැතිවෙනු සත්තයි
ඒ ගැන ඉතින් නොකියා බොරුවට බයිලා
ඉල්ලනු මැනවි ඒ මුළු මුදලම පිනට

වෙත්තසිංහ


සන්නස

**සංස්කරණය/Editor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සංස්කරණ සහය/Asst. Editors**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage
අසෝක සුබසිංහ Asoka Subasinghe
තුෂාරී ප්‍රියංගිකා Thushari Priyangika

**තාක්ෂණ සහය**
දසුන් ගජමන් Dasun Gajaman

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියාණි මද්දුමගේ
චන්දි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ
මේනකා ජයතිලක

සේයා රූ
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

පිටු සැකසුම/ග්‍රැෆික් නිර්මාණ
ජගත් ජේ එදිරිසිංහ
Page Layout & Graphic Designs
Jagath J Edirisinghe

**වර්ණ සංයෝජනය**
ඉනෝකා දිසානායක

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku
02 9626 7660
02 9837 5055

**WA**
Kapila Hemantha Balage
08 9456 1972

**QLD**
Ananada Samaratunga
07 3372 7953

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandta Eeriyagama

**TAS**
Anura Seneviratne
03 6327 4259



**Sannasa**
22 Lorne Street
Lalor Vic 3075 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasa@gmail.com
Tel/Fax : 03 9402 5380


පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

## සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය **ඉතා කෙටියෙන්** ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න.